සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

07 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 50 S

# නාට්‍ය හා රංග කලාව I කොටස

කාලය පැය දෙකයි

**නම හා අංකය :**

සැලකිය යුතුයි :- • සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
• අංක 1 - 20 දක්වා වූ ප්‍රශ්න වලට මෙම පත්‍රයෙහි ම පිළිතුරු සපයන්න.

• පහත තොරතුරු ඇසුරෙන් (1) - (5) දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

**A.** සුවඳ පද්ම ඕලු ආදී - නොයෙක පුෂ්පයෙන් සැදී

**B.** කටේ කිරි සුවඳ යන්නට පවා බැරි වුණා

**C.** අහසින් අවුත් මිණි අක් නයිඳු යැදුමට
රහතන් මැදෙහි මුනි හිඳ මිණි පලඟ පිට

**D.** අද වෙස්සන්තර රාජ පුතා, මන්ද්‍රී කුමාරි බදී

**E.** මහත් වැඩක් තව කියමි අසන්නේ
පහත් ව පා ළඟ දෙමාපියන්නේ

01. C අක්ෂරයෙන් දක්වා ඇති ගීත කොටස ඇතුලත් කථා විශේෂය වන්නේ,
(i) ජන කථාවකි (ii) වීර කථාවකි
(iii) ඓතිහාසික කථාවකි (iv) උපමා කථාවකි

02. 'ටිකිරි කුමරු' හා සම්බන්ධ ඓතිහාසික කථා පුවතට අදාළ ගීත ඛණ්ඩය අයත් අක්ෂරය වන්නේ,
(i) Aය (ii) B ය (iii) C ය (iv) D ය

03. ඉහත ගීත ඛණ්ඩ තුළින් නාට්‍ය ගීත වලට අදාළ අක්ෂර වනුයේ,
(i) AB ය (ii) CD ය (iii) DE ය (iv) AD ය

04. E අක්ෂරයේ ඇති ගීත ඛණ්ඩය ඇතුළත් ග්‍රන්ථය වනුයේ,
(i) ගුත්තිල කාව්‍යය. (ii) නම් පොත.
(iii) සිරිත් මල්දම. (iv) සුභාෂිතය.

• **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

05. "සිරි සඟබෝධි මාලිගාවේදී" යන ගීතය,
(i) නූර්ති ගීතයකි. (ii) නව නාට්‍ය ගීතයකි.
(iii) නාඩගම් ගීතයකි. (iv) සරල ගීතයකි.

06. නාට්‍යයක 'මකුට' ලෙස හඳුන්වනු ලබන්නේ,
(i) රංගාභරණය. (ii) පසුතල නිර්මාණය.
(iii) හිස් පළඳනාය. (iv) අංගරචනය.

07. නාට්‍යෝපකරණයක් නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ,
(i) සැහැල්ලු අමුද්‍රව්‍ය භාවිතා කළ යුතුය.
(ii) මිල අධික අමුද්‍රව්‍ය වලින් නිර්මාණය කළ යුතුය.
(iii) නළුවාගේ රංග කාර්යය පහසු විය යුතුය .
(iv) යොදා ගන්නා වර්ණ, ආලෝක වර්ණ හා ගැලපිය යුතුය.

08. නාට්‍යෝපකරණ නිර්මාණය සඳහා යොදා **නොගන්නා** අමුද්‍රව්‍යයක් වනුයේ,
(i) සිමෙන්ති. (ii) රෙදි. (iii) පත්තර. (iv) සැහැල්ලු ලී.

09. "අමර ගියා දිව්ය ලෝකේ" නාට්‍යයේ දැකිය හැකි චරිතයක් **නොවන්නේ,**

(i) බලු රාළ (ii) චාමර (iii) පූස්රාළ (iv) අම්මා

10. නම්‍යශීලී ශරීරයක් සඳහා රංගන ශිල්පියෙකු විසින් පුරුදු පුහුණු විය යුතු අභ්‍යාසයක් වන්නේ,

(i) නමනීකරණ අභ්‍යාස (ii) දර්පණ අභ්‍යාස

(iii) ශරීරය උණුසුම් කිරීමේ අභ්‍යාස (iv ශිථිලීකරණ අභ්‍යාස

- **ගැළපෙන පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න**

**(ඓතිහාසික කථා/රංගාභරණ/රංගභූමිය/ක්ෂණික නිරූපණ/උපමා කථා/රංගභාණ්ඩ/අභිරූපණ)**

11. නාට්‍ය පෙළක් නිර්මාණය සඳහා ........................................................................ යොදා ගත හැකිය.
12. පෙර සූදානමකින් තොරව සිදු කරන්නේ ................................................................ යයි.
13. මහින්දාගමනය, උන්මාද චිත්‍රා ආදී කථා ............................................................. වේ.
14. රංගයක් ඉදිරිපත් කරන ඕනෑම ස්ථානයක් ........................................................... ලෙස හඳුන්වයි.
15. කිණිස්ස, දුන්න, ඊතල .................................................... වේ.

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්න වලට හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

16. එළිමහන් හා ගෘහස්ථ ලෙස රංග භූමියේ ප්‍රධාන වර්ග දෙකකි. (..........)
17. ළමා නාට්‍යයක ප්‍රධාන චරිතය නාට්‍ය අවසානයේ දී අනිවාර්යයෙන් හොඳ චරිතයක් විය යුතුය. (..........)
18. චරිත ප්‍රධාන වශයෙන් මිනිස් හා සත්ව ලෙස ප්‍රධාන ප්‍රභේද දෙකකි. (..........)
19. 'මහතලා හටන' යනු වේදිකා නාට්‍යයකි. (..........)
20. රූපවාහිනි නාට්‍ය ශ්‍රව්‍ය දෘෂ්‍ය කලාවකි. (..........)

## II - කොටස

**සැලකිය යුතුයි.**

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

01. " අමර ගියා දිව්‍ය ලෝකේ" නාට්‍ය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
    i. මෙම නාට්‍යයේ අධ්‍යක්ෂවරයා නම් කරන්න. (ල. 02)
    ii. මෙහි එන ප්‍රධාන චරිතය නම් කරන්න. (ල. 02)
    iii. මෙම නාට්‍යයෙන් ගත හැකි ආදර්ශ 02ක් ලියන්න. (ල. 02)
    iv. මෙහි එන ප්‍රධාන චරිතය මුහුණපාන ගැටළුව විසඳා ගැනීමට අනෙකුත් චරිත ක්‍රියාත්මක වන ආකාරය කෙටියෙන් ලියන්න. (ල. 02)
    v. මෙම නාට්‍යයේ ඔබ සිත් ගත් චරියක් නම් කර එම චරිතයේ ලක්ෂණ 2 ක් ලියන්න. (ල. 02)

02. i. අනුෂාංගික කලා යනු කුමක් ද? (ල. 02)
    ii. වේදිකා නාට්‍යයක් සඳහා භාවිතා වන විවිධ කලා ප්‍රභේද 04 ක් ලියන්න. (ල. 03)
    iii. අනුෂාංගික කලා අංග සැලසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු අංග මොනවා දැයි ලියන්න. (ල. 05)

03. i. සාත්වික අභිනය යන්න හඳුන්වන්න. (ල. 02)
    ii. සාත්වික නිරූපණයේ දී සිදුවන භාවයන් 04 ක් ලියන්න. (ල. 03)
    iii. වේදිකා නාට්‍යයක් සඳහා ආහාර්ය අභිනය යොදා ගන්නේ කෙසේ දැයි පහදන්න. (ල. 05)

04. i. අභිරූපණ නාට්‍ය කලාව තුළ දී භාවිතා කරන ප්‍රධාන අභිනයන් නම් කරන්න (ල. 02)
    ii. අභිරූපණ රංගනයක විශේෂ ලක්ෂණ 04 ක් නම් කරන්න (ල. 03)
    iii. අභිරූපණ රංගන ශිල්පියෙකු ගේ අංග රචනය හා රංග වස්ත්‍ර පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 05)

05. i. රංග අභ්‍යාසයක් යනු කුමක් ද? (ල. 02)
    ii. ඔබ දන්නා රංග අභ්‍යාස 03 ක් නම් කරන්න. (ල. 03)
    iii. රංග අභ්‍යාස තුළින් නළුවා තුළ වර්ධනය වන ගුණාංග 05 ක් ලියන්න. (ල. 05)

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
# නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය

## 7 ශ්‍රේණිය

### I - කොටස

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 02. | 2 | 03. | 4 | 04. | 3 | 05. | 1 | 06. | 3 |
| 07. | 2 | 08. | 1 | 09. | 2 | 10. | 4 | 11. | උපමා කථා | | |
| 12. | ක්ෂණික නිරූපණ | | | 13. | ඓතිහාසික කථා | | | 14. | රංග භූමිය | | |
| 15. | රංග භාණ්ඩ | | | 16. | ✓ | 17. | ✓ | 18. | ✗ | 19. | ✗ |
| 20. | ✓ | | | | | | | | | | |

**07 ශ්‍රේණිය**

# නාට්‍ය හා රංග කලාව
## ප්‍රායෝගික පරීක්ෂණය - 2019

**ගුරුභවතුන් සඳහා පමණි**

★ප්‍රයෝගික පරීක්ෂණය සඳහා සියළුම ළමුන් යොමු කර ගත යුතුයි.
★මේ සඳහා විභාගයට පෙරද කාලය යොදා ගත හැකිය.

01. සිසුන් පෙර සූදානමකින් යුතුව පැමිණෙන නාට්‍ය ගීතයක් ගායනයෙන් හා රංගනයෙන් ඉදිරිපත් කළ යුතුය (ල. 10)

02. කථා පුවතක් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම (ල. 10)
මෙහිදී සිසුවා කැමති ජන කථාවක්/උපමා කථාවක්/සුරංගනා කථාවක් හෝ ඕනෑම කථා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කළ යුතුය.

03. පහත සඳහන් මාතෘකා අතරින් එකක් අහඹු ලෙස තෝරා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දී, ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කිරීම කළ යුතුයි. (ල. 10)
i. සැක කටයුතු පාර්සලයක් හමු වී....
ii. කුණාටු සහිත වැසි දිනකදී කුඩයක් නොමැතිව......
iii. නයි නටවන්නෙකු ගේ නයි පෙට්ටියේ සිටි නයා අතුරුදහන් වීම...
iv. ක්‍රීඩා කරමින් සිටින විට තම යහළුවා අනතුරකට පත් වීම
v. පිටරට ගිය මව පැමිණෙන දිනය අදයි
vi. තනිව, රාත්‍රියේ නිවසේ සිටින විට කිසිවෙකු දොරට තට්ටු කරයි.

04. "පුංචි අපට දැන් තේරෙයි" නාට්‍යයේ සංවාද කොටසක් රංගනයෙන් ඉදිරිපත් කළ යුතුය. (ල. 10)

05. පෙර සූදානමකින් යුතුව පැමිණ සාමූහික නාට්‍යය ඉදිරිපත් කිරීම කළ යුතුය (ල. 10)